# සුභාෂිතය කෘතියෙන් නිරූපණය වන චරිතායන අධ්‍යාපනයේ මූලධර්ම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*ඩබ්.ආර්.ජී ඉසුර උදයංගන [1], එම්.ඩබ්.අයි.ජී. සිල්වා [2]*

සදාචාරාත්මක වටිනාකම් හා තීරණ ගැනීම පිළිබඳව ඉගැන්වීම හා ප්‍රායෝගික අභ්‍යාස මඟින් යහපත් චරිතයක් ගොඩනැංවීමේ උත්සාහය චරිතායන අධ්‍යාපනය නම් වේ. පුද්ගලයා වගකීම් සහගතව හා පරාර්ථකාමීව උත්තුංග මානුෂීය ගුණ ධර්මයන්ගෙන් තම ජීවිතය හැඩගස්වා ගැනීමට අවශ්‍ය මඟ පෙන්වීම ඉන් ලබා දෙයි. අලගියවන්න මුකවෙටි තුමා විසින් විරචිත සුභාෂිතය වූ කලී, ජීවත්වීමට අවැසි සමාජීය දැනුම පමණක් නොව හදවත හා බැඳුණු මානව හිතවාදී ගුණධර්ම බුදු දහමේ අධ්‍යාත්මික ඉගැන්වීම් සමඟ විශද කිරීමට සමත් ලාංකීය සම්භාව්‍ය සාහිත්‍ය අවධියේදී රචිත උපදේශාත්මක ග්‍රන්ථයකි. සුභාෂිතය ග්‍රන්ථයේ අන්තර්ගත චරිතායන අධ්‍යාපනික මූලධර්මයන් මොනවාද? යන්න මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වේ. ගුණගරුක සමාජයක් නිර්මාණය කිරීමට සුභාෂිතය කෘතියේ ඇති මහඟු දායකත්වය පෙන්වා දීමත්, එහි සාහිත්‍යාත්මකව ගැබ්ව ඇති චරිතායන අධ්‍යාපනයේ මූලධර්ම පෙන්වා දීමත් මෙම අධ්‍යයනයෙහි පර්යේෂණ අරමුණ වේ. අන්තර්ජාල සමීක්ෂණය හා පුස්තකාලය අධ්‍යයනය මඟින් මෙම පර්යේෂණය සඳහා දත්ත ලබා ගැනීම සිදු කෙරුණි. මෙම අධ්‍යයනයේදී, සුභාෂිතය මත පදනම්ව තේමා විශ්ලේෂණය සහ අන්තර්ගත විශ්ලේෂණය අනුගමනය කරමින් ගුණාත්මක දත්ත විශ්ලේෂණ ප්‍රවේශය මත පර්යේෂණය සිදු කරන ලදී. වර්තමානයේ ප්‍රබල ගැටළුවක් වූ සමාජීය ගැටුම් නිරාකරණය පිණිස ඖචිත්‍ය පියවරක් වශයෙන් චරිතායන අධ්‍යාපනයේ දැඩි අවශ්‍යතාව මෙමඟින් හඳුනාගත හැකි විය. ඒ අනුව සදාචාරාත්මක සමාජයක් ගොඩනැගීමේ පරමාර්ථය ඉටු කළ හැකි සමාජ කොට්ඨාසය ලෙස ළමා පරපුර හඳුන්වා දිය හැකිය. විනයානුකූල ශික්ෂණයකින් ළමා පරපුරක් නිර්මාණය කිරීම සඳහා සුභාෂිත කතුවරයා ප්‍රධාන ශික්ෂණ අවදි හතර මූලික කරගෙන ඇති බව මෙම අධ්‍යයනය මගින් අනාවරණය විය. එසේම, චරිතාන අධ්‍යාපනයක තිබිය යුතු බවට පර්යේෂකයන් විසින් සොයාගත් මූලධර්ම වන චේතනාව යහපත් වීම, අපක්ෂපාතී බව, යථාර්ථවාදී බව, ස්වයං විනය, වගකීම් සහගත බව, ආදර්ශමත් බව හා චරිත සංවර්ධනය යන චරිතායන අධ්‍යාපනික මූලධර්මයන් සුභාෂිතයේ ගැබ් වී ඇත. චරිතායන අධ්‍යාපනික මූලධර්මයන් සේම බටහිර න්‍යායක් වන බැන්ඩුරාගේ සමාජ ඉගෙනුම් න්‍යාය සහ ප්‍රතිවිපාකවාදී න්‍යායේ ලක්ෂණද සුභාෂිතයේ ගැබ්ව ඇත. චරිතායන අධ්‍යාපනයේ පවත්නා වූ මූලධර්ම සාහිත්‍යාත්මක රසයකින් සුසංයෝජන වෙමින් කාව්‍යාත්මක උපක්‍රමයන්ගෙන් සුභාෂිතය රචනා විය. ජාති, ආගම්, කුල භේද නොසලකමින් සාරධර්මවලින් පෝෂිත වූ සදාචාරාත්මක සමාජයක් නිර්මාණය කිරීමේදී සාහිත්‍යකරුවාගේ භූමිකාව සුභාෂිතය උපදේශාත්මක ග්‍රන්ථයෙන් ඉටුවී ඇති අතර ඉන් නිරූපිත චරිතාන අධ්‍යාපනයේ මූලධර්ම සුචරිතවත් ළමා පරපුරක් නිර්මාණය කිරීමට ප්‍රායෝගිකව දායක වන බව මෙමගින් නිගමනය විය.

***ප්‍රමුඛ පද:*** චරිතායන අධ්‍යාපනය, මූලධර්ම, සදාචාරය, සුචරිතවත් සමාජය, සුභාෂිතය

[1] සිංහල අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. isura.17893@uhss.ruh.ac.lk
[2] ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. madusankabandaranayaka42@gmail.com